# පාර්ලිමේන්තු අයවැය කාර්යාලය

# ඇබෑර්තු

2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පනතින් මා වෙත ලබා දී ඇති බලතල අනුව පාර්ලිමේන්තු අයවැය කාර්යාලයේ පුරප්පාඩුව පවතින **"පාර්ලිමේන්තු අයවැය නිලධරයා"** සහ **"නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා"** තනතුරු සඳහා දක්ෂ, අවංක, උසස් සදාචාරාත්මක ගුණභාවයක් සහ කීර්ති නාමයක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මූල්‍ය වගකීම් ඉටු කිරීමේදී ව්‍යවස්ථාදායකයට සහාය වීමේ අරමුණින් පාර්ලිමේන්තු අයවැය කාර්යාලය පිහිටුවා ඇත.

පාර්ලිමේන්තු අයවැය කාර්යාලය ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන, කිසිදු දේශපාලන බලපෑමකින් තොරව ක්‍රියාත්මක විය යුතුය. තවද එය නිසි සුදුසුකම් සහිත ආර්ථික විද්‍යාඥයින් සහිත කාර්ය මණ්ඩලයකින් සමන්විත විය යුතු අතර, උසස් තත්වයේ විශ්ලේෂණ සහ වාර්තා සම්පාදනය කිරීමේ කාර්යය මූලික රාජකාරීන් වේ.

ඒ සඳහා වන අයැදුම්පත් **2024 මැයි මස 06** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයැදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතු ය. (මෙම තොරතුරු www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය)

## 1. පාර්ලිමේන්තු අයවැය නිලධරයා

### 1.1. වැටුප් පරිමාණය

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 358,150 – 5X10,030 – 408,360/- වේ. (අනෙකුත් අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 665,000/– පමණ වේ)

### 1.2. වයස් සීමාව

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

### 1.3 පළපුරුද්ද :

රජයේ අයවැයකරණය, මූල්‍ය ප්‍රතිපත්ති, ආදායම් ප්‍රතිපත්ති හෝ සාර්ව ආර්ථික විශ්ලේෂණයේ අවම වශයෙන් අවුරුදු 15ක පළපුරුද්ද.

## 2. නියෝජ්‍ය පාර්ලිමේන්තු අයවැය නිලධරයා

### 2.1. වැටුප් පරිමාණය

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 302,510 - 5X8,470 - 344,860/- වේ.

(අනෙකුත් අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 560,000/– පමණ වේ)

### 2.2. වයස් සීමාව

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

### 2.3 පළපුරුද්ද

රජයේ අයවැයකරණය, මූල්‍ය ප්‍රතිපත්ති, ආදායම් ප්‍රතිපත්ති හෝ සාර්ව ආර්ථික විශ්ලේෂණයේ අවම වශයෙන් අවුරුදු 10ක පළපුරුද්ද

## 3. අධ්‍යාපන සුදුසුකම්

- ආර්ථික විද්‍යාව, ව්‍යාපාර, මූල්‍ය, දේශපාලන විද්‍යාව හෝ රාජ්‍ය පරිපාලනය වැනි අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයක පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක්.
- පිළිගත් පශ්චාත් උපාධියක් හෝ ආර්ථික විද්‍යාව, රාජ්‍ය ප්‍රතිපත්ති, කළමනාකරණය, ව්‍යාපාර හෝ මූල්‍ය පිළිබඳ සැලකිය යුතු පළපුරුද්දක්.
- ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ (පෞද්ගලික / රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය නොවන සංවිධානයක) සැලකිය යුතු කළමනාකරණ / පර්යේෂණ පළපුරුද්දක්; සහ
- රාජ්‍ය අංශයට පරිපූර්ණව සම්බන්ධ, ඉහළ මට්ටමේ අයවැයකරණය, ආර්ථික, සහ/හෝ මූල්‍ය විශ්ලේෂණ වලට නායකත්වය දෙන සැලකිය යුතු පළපුරුද්දක්.

## 4. අපේක්ෂිත කුසලතා සහ නිපුණතා:

- ශ්‍රී ලංකා රජයේ අයවැය ක්‍රියාවලිය, වියදම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ වගවීම සහ විනිවිදභාවය වැනි රාජ්‍ය අංශයේ කළමනා කරණ මූලධර්ම පිළිබඳ දැනුම.
- රාජ්‍ය මූල්‍ය, සාර්ව ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්තිවල මූලධර්ම සහ භාවිතයන් පිළිබඳ සැලකිය යුතු අවබෝධයක්.
- රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාපිත වගකීම් සහ විවිධ පාර්ලිමේන්තු පාර්ශ්වකරුවන් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳ අවබෝධය.
- පුද්ගල සහ ආයතනික ස්වාධීනත්වය පවත්වා ගෙන යන ආකාරයෙන් සංකීර්ණ, පක්ෂග්‍රාහී තත්වයන් තුළ තරඟකාරී අවශ්‍යතා සඳහා සැරිසැරීමට සහ ප්‍රතිචාර දැක්වීමට ඇති හැකියාව.
- ශිල්පීය නොවන ප්‍රේක්ෂකයින්ට පැහැදිලි භාෂාවෙන් සංකීර්ණ තොරතුරු ඉක්මනින් සංස්ලේෂණය කිරීමට සහ ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට සහ මහජනතාව, මාධ්‍ය, රාජ්‍ය ආයතන, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රජයන් සහ වෙනත් සංවිධාන සමඟ අන්තර් ක්‍රියා කිරීමේදී ප්‍රකාශකයෙකු ලෙස ක්‍රියා කිරීමේ හැකියාව.

## 5. අපේක්ෂිත ගුණාංග:

- අවංකත්වය සහ උසස් සදාචාරාත්මක චර්යාව.
- අපක්ෂපාතීත්වය සහ ස්වාධීනත්වය.
- උපාය මාර්ගික චින්තකත්වය.
- පාක්ෂික තත්ත්වයන්හිදී ස්ථාවර විනිශ්චය සහ ස්ථානෝචිත බව.
- විශිෂ්ට අන්තර් පුද්ගල කුසලතා.
- ඉහළ ක්‍රියාකාරී කණ්ඩායම් මෙහෙය වීමේ සහ කළමනාකරණය කිරීමේ පළපුරුද්ද.

## 6. බඳවා ගැනීමේ ක්‍රමය:

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 7. සේවා නියමයන් හා කොන්දේසි :

2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාල පනතට යොමුවන්න
*http://www.documents.gov.lk/files/act/2023/6/06-2023_S.pdf*

## 8. නුසුදුසුකම්

2023 අංක 6 දරන පාර්ලිමේන්තු අයවැය කාර්යාල පනතට යොමුවන්න
*http://www.documents.gov.lk/files/act/2023/6/06-2023_S.pdf*

**9.** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඇ) වෘත්තියමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

**10.** රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

**11.** තනතුර ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

**12.** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,**
**2024 අප්‍රේල් මස 5 වැනි දින.**

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**